**ශීර්ෂය 124 - සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

ශීර්ෂය 124 - සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 සැප්තැම්බර් 29 දින අමාත්‍යාංශයේ ලේකම් වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 12,046.16 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 11,622.13 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය වෙත සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 424.03 ක් හෙවත් සියයට 3.52 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 11,791.73 | 11,383.25 | 407.48 | 3.46 |
| මූලධන | 255.43 | 238.88 | 16.55 | 6.48 |
| **එකතුව** | **12,046.16** | **11,622.13** | **424.03** | **3.52** |

## 2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

### පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්

අමාත්‍යාංශයට අදාළ විෂය අංක 12401 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 15.00 | 14.58 | 6.00 | 8.43 | 48.00 | 35.72 |

## 2.3 පොදු තැන්පත් ගිණුම්

අමාත්‍යාංශය යටතේ වන පොදු තැන්පත් ගිණුම් 05 ක 2016 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු.මිලියන 4.03 ක් විය. විස්තර පහත දැක්වේ.

| ගිණුම් අංකය | 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0002/0129/000 | 0.49 |
| 6000/0000/00/0013/0086/000 | 0.01 |
| 6000/0000/00/0016/0078/000 | 3.51 |
| 6000/0000/00/0018/0121/000 | 0.02 |
| **එකතුව** | **4.03** |

## 2.4 විගණන නිරීක්ෂණය

සමාජ සවිබලගැන්වීමේ හා සුභසාධන අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 දේශීය මූල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

**ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ස්වේච්ඡා කටයුතු පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය ස්ථාපනය කිරීම සඳහා 2014 ඔක්තෝබර් 16 දින අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී තිබුණි. එම ලේකම් කාර්යාලය පිළිබඳව නීතිමය පිළිගැනීමක් ලබාගැනීම සඳහා අවශ්‍ය ජාතික ප්‍රතිපත්තියක් පිළියෙල කර අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකාවේ පවුල් ප්‍රතිපත්තිය සඳහා මාර්ගෝපදේශ සංග්‍රහයක් සකස් කර මාස 02 ක් ඇතුළත ඉදිරිපත් කිරීමට යටත්ව 2012 පෙබරවාරි 22 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි. මේ සඳහා 2017 අගෝස්තු 31 දිනට වර්ෂ 05 මාස 08 ක කාලයක් ගතවී තිබූ අතර, 2012 වර්ෂයේ සිට 2015 වර්ෂය අවසාන වන විට එකතුව රු.1,087,438 ක් වියදම් කර තිබුණි. කෙසේ නමුත් අදාළ මාර්ගෝපදේශ සංග්‍රහයේ කටයුතු සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිමකර නොතිබුණි.

**3.2 කාර්යසාධනය**

**ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්**

අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටු කර නොතිබුණු අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) දිවයින පුරා සිටින වයස අවුරුදු 70 ට වැඩි මූල්‍යාධාර ලබන වැඩිහිටියන් සම්බන්ධව දත්ත පද්ධතියක් සකසා යාවත්කාලීන කර පවත්වා නොතිබුණි.

(ආ) අඩු ආදායම්ලාභී වයස අවුරුදු 70 ට වැඩි පුරවැසියන් සඳහා රු.2,000 ක දීමනාවක් ලබාදීමට සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 9,262.37 ක ප්‍රතිපාදන අමාත්‍යාංශය වෙත සලසා දී තිබුණි. ඉන් රු.මිලියන 9,059.59 ක් වැයකර තිබුණි. ඒ අනුව සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් රු.මිලියන 202.76 ක් ඉතිරි කර තිබුණි. එසේම එම දීමනාවෙන් නැවත රු.100 ක් අඩුකර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් වැඩිහිටි මහලේකම් කාර්යාලය වෙත ලබාදීමට අමාත්‍ය මණ්ඩල අනුමැතියක් ලබාදී තිබුණි. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂයේදී එසේ ලැබී තිබුණු රු.මිලියන 427.70 ක් 2017 අගෝස්තු 31 දින වන විටත් නිෂ්කාර්යව පැවතිණි. වාර්ෂික ඇස්තමේන්තු හරහා අඩු ආදායම්ලාභී වයස අවුරුදු 70 කට වැඩි පුරවැසියන්ට ගෙවීම සඳහා ලබාදෙන ලද රු.2,000 ක දීමනාවෙන් රු.100 ක් අඩුකිරීම, දීමනා ලබාදීමේ අරමුණ ඉටුවීම පිළිබඳව මතභේදාත්මක වී තිබුණි.

(ඇ) දිස්ත්‍රික්ක 09 ක වකුගඩු රෝගයෙන් පෙළෙන රෝගීන්ට මසකට රු.3,000 ක් බැගින් ජීවනාධාර ගෙවීම සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මගින් රු.මිලියන 667.22 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර වර්ෂය අවසානයට ඉන් රු.මිලියන 180.42 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී හඳුනාගත් රෝගීන් 19,645 කින් රෝගීන් 15,453 කට පමණක් ආධාර ගෙවා තිබුණි. කෙසේ වුවද, පොරොත්තු ලේඛනයේ ආධාර අපේක්ෂිතව රෝගීන් 4,192 ක් සිටියද, ඒ පිළිබඳව අමාත්‍යාංශයේ අවධානය යොමු වී නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය ආරම්භයේදී පොරොත්තු ලේඛන ගතව සිටින වකුගඩු රෝගීන් හඳුනාගෙන තිබුණද වර්ෂය අවසානයේදී දිස්ත්‍රික්ක 09 ක් සඳහා යවන ලද රු. මිලියන 607.38 ක ප්‍රතිපාදනවලින් වර්ෂය අවසාන වන විට රු.මිලියන 122.67 ක් ඉතිරි කර තිබුණි. කෙසේ වුවද, එම ප්‍රතිපාදන හඳුනාගත් ප්‍රතිලාභීන් වෙත ලබාදීමට විධිමත් ලෙස සැලැසුම් කර නොතිබුණි.

(ඉ) වකුගඩු රෝගයෙන් පීඩා විඳින රෝගීන්ට මාසික මූල්‍යාධාර ගෙවීම 2016 ජනවාරි මාසයේ සිටම ආරම්භ කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන නිදහස් කළ යුතු වුවත්, හම්බන්තොට දිස්ත්‍රික්කයට 2016 ජනවාරි මාසයේදී රු.මිලියන 3.87 ක ප්‍රතිපාදනය ලබාදී තිබුණද, ආධාර මුදල් මාස 05 ක් ප්‍රමාද කර 2016 ජූනි මාසයේ සිට ගෙවා තිබුණි.

(ඊ) උපදේශන අංශය විසින් දැනුවත් කිරීමේ වැඩසටහන් වෙනුවෙන් සඟරා 1500 ක්, අත්පත්‍රිකා 30,000 ක් හා සේවාලාභීන් ඇගයීමේ ආකෘති පත්‍ර 20,000 ක් සැකසීමට රු.2,300,000 ක ප්‍රතිපාදන සළසා තිබුණි. කෙසේවුවද, ඉන් අත්පත්‍රිකා 30,000 සකස් කර නොතිබුණු අතර සේවාලාභීන් ඇගයීමේ ආකෘති පත්‍ර 462,500 ක් සහ බැනර් 180 ක් සහ සඟරා 1,500 සකස් කිරීමට රු.2,010,000 ක් වැය කර තිබුණි.

## 3.3 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 49 | 33 | 16 |
| (ii) | තෘතියික මට්ටම | 05 | 03 | 02 |
| (iii) | ද්විතියික මට්ටම | 471 | 307 | 164 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 83 | 71 | 12 |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | 04 | 03 | 01 |
| | **එකතුව** | **612** | **417** | **195** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 193 ක් පිරවීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි. කෙසේ වෙතත් මුළු පුරප්පාඩු වලින් 111 ක් උපදේශන නිලධාරී තනතුරු වූ අතර ප්‍රාදේශීය ලේකම් කාර්යාල 147 ක උපදේශන නිලධාරීන්ගේ පුරප්පාඩු පැවතිණි. මෙම නිලධාරීන් අනුයුක්ත කිරීමට නොහැකිවීම මත අදාළ බොහෝ සැලැසුම් නිසිපරිදි ක්‍රියාත්මක කිරීමට නොහැකිවී තිබුණි.

(ආ) අමාත්‍යාංශයේ අනුමත කාර්ය මණ්ඩලයට තාක්ෂණික නිලධාරීන් 02 කු අයත්වූ නමුත් ආරම්භයේ සිටම බඳවා නොගැනීම නිසා ප්‍රසම්පාදන කමිටුවල අවශ්‍යතාවයන්ට සහ ආබාධිත තැනැත්තන් සඳහා ප්‍රවේශ පහසුකම් ලබා දිය යුතුව පවතින සියළුම ගොඩනැගිලි, ප්‍රසිද්ධ ස්ථාන හා පොදු සේවා ස්ථාන ආබාධිත සහිත තැනැත්තන්ට ප්‍රවේශවීමට හැකිවන ආකාරයට සකස් කර ඇති බව තහවුරු කිරීමට අදාළ පරීක්ෂාවන් කිරීමට නොහැකිවී තිබුණි.